# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශේෂ

අංක 1849/26 - 2014 පෙබරවාරි මස 13 වැනි බ්‍රහස්පතින්දා - 2014.02.13

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# I වැනි කොටස: (I) වැනි ඡේදය - සාමාන්‍ය

## ජනාධිපතිතුමාණන් විසින් කරන ලද ප්‍රකාශන ආදිය

### ජනාධිපති විධානය

මහින්ද රාජපක්ෂ.

1. මහාචාර්ය හිතනාදුර ජානක ද සිල්වා මැතිතුමා
2. මහාචාර්ය කාමිනි නිර්මලා මෙන්ඩිස් මැතිතුමිය
3. මහාචාර්ය ආනන්ද රාජිත වික්‍රමසිංහ මැතිතුමා
4. මහාචාර්ය හේමා මාලිනි කුඹල්ගොඩ කංකානම් පතිරණ මැතිතුමිය
5. මහාචාර්ය හේමන්ති රණසිංහ මැතිතුමිය
6. මහාචාර්ය විජේරූපගේ සන්ධ්‍යා සුලෝචනා විජේසුන්දර මැතිතුමිය
7. මහාචාර්ය ලක්ෂ්මන් ලොයිඩ් රත්නායක මැතිතුමා
8. මහාචාර්ය අවුරෙලියා ජෙනිෆර් පෙරේරා මැතිතුමිය
9. මහාචාර්ය දෙල්ගහවත්තගේ රාජ් කුමාර් සෝමදේව දෙල්ගහවත්ත මැතිතුමා
10. මහාචාර්ය විරංජිත් ප්‍රියාන් සොලමන් ඩයස් මැතිතුමා
11. මහාචාර්ය කදිරගාමනාදන් කන්දසාමි මැතිතුමා
12. මහාචාර්ය අරුණි තිලකරත්න මැතිතුමිය
13. ආචාර්ය නන්ද අමරසේකර මැතිතුමා
14. ආචාර්ය රොහාන් ප්‍රසන්ත පෙරේරා මැතිතුමා
15. ආචාර්ය ගල්බඩ ආරච්චිගේ සිරිමල් ප්‍රේමකුමාර මැතිතුමා
16. මොක්සෙවි ප්‍රේලිස් මැතිතුමා

වෙත,

ශුභාශිංසන පෙරටුවයි !

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 33 වැනි ව්‍යවස්ථාවෙන් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර, වර්ෂ 2013 සැප්තැම්බර් මස 09 වැනි දිනැති ජනාධිපති විධානය මගින් සංශෝධිත 2007 ජූලි මස 24 වැනි දිනැති ජනාධිපති විධානය මගින් ජාතික පර්යේෂණ සභාව පිහිටුවනු ලැබූ හෙයින් ද,

තව ද, එකී සභාවේ සාමාජික ආචාර්ය නිහාල් ජිනසේන මැතිතුමා සිය සාමාජික ධුරයෙන් ඉල්ලා අස්වී ඇති හෙයින් ද,

තව ද, එකී සභාව තුළ කෘෂිකාර්මික අංශය නියෝජනයවීමේ බලවත් අවශ්‍යතාව හඳුනාගෙන ඇති හෙයින් ද,

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ජනාධිපති මහින්ද රාජපක්ෂ වන මම, පේරාදෙණිය විශ්වවිද්‍යාලයේ කෘෂිකර්ම පීඨයේ භෝග විද්‍යා දෙපාර්තමේන්තුවේ මහාචාර්ය වීරතුංග ආරච්චිගේ ජනේන්ද්‍ර මාතලී ද කොස්තා මැතිතුමාගේ විචක්ෂණභාවය, සාමර්ථ්‍යය හා විශ්වාසවන්තභාවය කෙරෙහි මහත් වූ භක්තිය හා විශ්වාසය තබමින් මහාචාර්ය වීරතුංග ආරච්චිගේ ජනේන්ද්‍ර මාතලී ද කොස්තා මැතිතුමා පූර්වෝක්ත ජනාධිපති විධානය ප්‍රකාරව පිහිටුවනු ලැබූ ජාතික පර්යේෂණ සභාවේ සාමාජිකයෙකු ලෙස මෙයින් පත් කරමි.

වර්ෂ දෙදහස් දහහතරක් වූ පෙබරවාරි මස 12 වැනි දින වන මෙදින ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුද්‍රාව යටතේ කොළඹ දී දෙන ලදී.

අතිගරු ජනාධිපතිතුමාගේ අණ පරිදි,

ලලිත් වීරතුංග,
ජනාධිපති ලේකම්.

02 - 828

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.